**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්බොන් වැලිගම්පොල ප්‍රජාශාලාව අලුත්වැඩියාව සඳහා වැය කළ රු.150,000 ක පුනරාවර්තන වියදමක් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මගින් නිවැරදි කරන බව | වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ දී මිලදී ගන්නා ලද රු.85,950 ක කාර්යාල මේස 04 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,457,550 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අපහරණය කරන ලද එකතුව රු.82,450 ක වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | -එම- | වෙන්දේසි හා විනාශ කළ භාණ්ඩ හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.509,262 ක් වටිනා ගිණුම් ශේෂ 07 ක් උපලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | මෙහි සඳහන් ශේෂයන් පිළිබඳව තවදුරටත් සොයා බලා නිරවුල් කරන බව | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ සඳහා ලේඛන හා උපලේඛන ඉදිරිපත් කළ යුතුය |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2018 අප්‍රේල් 24 දිනැති අංක 2018/05 දරන චක්‍රලේඛය | සේවකයින් දෙදෙනෙකු දෛනික පදනම මත බඳවා ගෙන 2019 අගෝස්තු මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා කාල පරාසය තුළ වැටුප් ලෙස රු.2,392,000 ක් ගෙවා තිබුණි. | සභාවේ පවතින කම්කරු පුරප්පාඩු හේතුවෙන් කම්කරුවන් බඳවා ගැනීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. ඒ අනුව අප විසින් කරන ලද ඉල්ලීම් සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය මත බඳවා ගැනීමට කටයුතු කළ බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,076,675 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,750,304 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 5,540,000 | 5,364,782 | 4,686,432 | 6,044,710 | 4,895,000 | 5,282,238 | 5,488,058 | 5,366,360 |
| (ii) | කුලී | 3,313,475 | 1,830,956 | 2,216,407 | 447,584 | 4,351,441 | 1,875,533 | 1,129,214 | 833,035 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 879,850 | 832,410 | 765,110 | 573,000 | 900,900 | 885,186 | 779,786 | 505,700 |
| (iv) | වෙනත් ආදායම් | 30,363,750 | 29,488,871 | 29,915,721 | 25,459,581 | 30,388,000 | 30,179,332 | 22,678,941 | 25,886,431 |
| | එකතුව | 40,097,075 | 37,517,019 | 37,583,670 | 32,524,875 | 40,535,341 | 38,222,290 | 30,075,998 | 32,591,526 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වරිපනම් දේපළ 24 කින් අය විය යුතු එකතුව රු.173,274 ක් විය. | හිඟ වරිපනම් මුදල අය කර ගැනීමට ආදායම් පරීක්ෂකවරු දැනුවත් කර ඇති බව | හිඟ වරිපනම් අය කර ගත යුතුය |
| (ආ) | **අක්කර බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකකයක හිඟය රු.1,000 ට වඩා වැඩි අක්කර බදු අය කරනු ලබන දේපළ 34 කින් අය විය යුතු මුදල රු.127,672 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ අක්කර බදු අය කර ගත යුතුය |
| (ඇ) | **ජල බදු** | | |
| i. | සභාව සතු ජල ව්‍යාපෘති 17 කට අදාළව ජල පාරිභෝගිකයින් 1,093 ක ගෙන් වසරකට වඩා වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂය රු.3,975,544 ක් විය. | -එම- | හිඟ ජල ගාස්තු අය කර යුතුය |
| ii. | සභාවට අයත් ජල ව්‍යාපෘති 04 ක නව ජල සම්බන්ධතා ලබා දීමේ දී ජල පාරිභෝගිකයින් 530 කගෙන් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අය කළ යුතු එකතුව රු.3,603,141 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල සම්බන්ධ මුදල අය කර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති බව | -එම- |
| (ඈ) | **දැන්වීම් පුවරු ගාස්තු**<br>සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබුණු දැන්වීම් පුවරු 15 ට අදාළව වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පවතින හිඟ ශේෂය රු.247,517 ක් විය. | හිඟ මුදල් ගෙවන ලෙස අදාළ ආයතනවලට ලිඛිතව දන්වා ඇති බව | දැන්වීම් පුවරු ගාස්තු අය කළ යුතුය |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,335,534 ක් හා මුද්දර ගාස්තු රු.19,653,250 ක් විය. | මුද්දර ගාස්තු හිඟ මුදල හා උසාවි දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.77,415,330 ක් වූ අතර ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයට අදාළ රු.15,456,641 ක් හා වසර 05 ට වැඩි ශේෂය රු.1,942,680 ක් විය. | මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ශේෂ අය කර ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.83,980,932 ක් වූ අතර ඉන් වසර 01 ත් 05 ත් අතර කාල පරාසයකට අදාළ ශේෂය රු.18,259,341 ක් හා වසර 05 ට වැඩි ශේෂය රු.2,145,607 ක් විය. | මුදල් ප්‍රතිපූර්ණය වී නොමැති බැවින්, ගෙවීම් කළ නොහැකි වූ බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 සිට 2021 වර්ෂය දක්වා කාල පරාසය තුළ සංවර්ධන බලපත්‍ර සඳහා අයදුම්පත් 364 ක් ලැබී තිබුණු අතර, අනුමත අයදුම්පත් ගණන 331 ක් විය. එසේ වුව ද, එම කාලය තුළ අනුකූලතා සහතික 58 ක් පමණක් නිකුත් කර තිබුණි. | 2018 හා 2019 අනුකූලතා සහතික 51 ක් නිකුත් කර ඇති අතර, 2020 හා 2021 වර්ෂවල අනුමත අයදුම්පත් සඳහා වර්ෂ 03 ක් ගත වූ පසු දැනුවත් කිරීම් නැවත සිදු කිරීමට යෝජිත බව | අනුකූලතා සහතික නිකුත් කළ යුතුය |
| (ආ) | වරිපනම් අය කිරීම සඳහා නව දේපළ තක්සේරුවක් සිදු නොකර, 2011 වර්ෂයේ සිදු කරන ලද දේපළ තක්සේරුව මත වරිපනම් අය කර තිබුණි. | දේපළවල වාර්ෂික වටිනාකම් ප්‍රතිශතාත්මකව ප්‍රතිශෝධනයක් සුදුසු බවට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මෙතෙක් ලැබී නොමැති බව | වරිපනම් දේපළ තක්සේරු කළ යුතුය |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමෙන් බදු ලෙස ලබා ගත් අක්කර 02 කින් යුත් ගල් වලවල් 02 ක් සහිත කළුගල් ඉඩමක් ටෙන්ඩර් කර වර්ෂ 05 කට බදු දීමේදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා නොගෙන කළුගල් කියුබ් 01 ට රු.200 ක අවම ලංසුවක් තීරණය කර බදු දී තිබුණි. | සියලු සුදුසුකම් සපුරන ටෙන්ඩර්කරුවකු එක් ගල් කියුබ් එකක් සඳහා අවම ලංසුව ලෙස රු.100 ක් ලබා ගැනීම සුදුසු බව තාක්ෂණ ඇගයීම් කමිටුවේදි තීරණය කර ඇති බව | තක්සේරු කර ලංසු මුදල් තීරණය කළ යුතුය |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ලේඛනවලට අනුව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිතිය පවතින සුසාන භූමි 13 ක් හා ප්‍රාදේශීය ලේකම්ට අයිතිව පවතින සුසාන භූමි 17 ක් පවතින බව දක්වා තිබුණ ද, 2020 වර්ෂයේ වත්කම් සමීක්ෂණ මණ්ඩලය විසින් සුසාන භූමි 24 ක් පමණක් හඳුනා ගෙන තිබුණි. මෙම සුසාන භූමි ප්‍රාදේශීය සභාව වෙත පවරා ගෙන ද නොතිබුණි. | සුසාන භූමි සභාව වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව | සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 128 වගන්තිය ප්‍රකාරව, පොදු පහසුකම් සැපයීම වෙනුවෙන් සභාව විසින් ඉදිකර තිබුණු ප්‍රජාශාලා 34 ක් පිහිටි ඉඩම් කොටස්වල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | ප්‍රජාශාලා පවරා ගැනිමේ කටයුතු සිදු වෙමින් පවතින බව | ප්‍රජාශාලා පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **ගලමුදුන ක්‍රීඩා පිටිය අසළ සිට ලයින් කාමර අංක 01 දක්වා මාර්ගය සංවර්ධනය කිරීම රු.498,350** | | |
| (අ) | ඇස්තමේන්තු බිල්පත් අනුව, මාර්ගයේ අතුරන ලද කොන්ක්‍රීට් ස්ථරය අඟල් 06 ක ඝණකමින් ඉදිකළ යුතු වුව ද, මාර්ගයේ මීටර් 20 ක් හා 48 ක් දුරින් ලබා ගත් Core කැපුම් අනුව, එහි ඝණකම අඟල් 05 ක් පමණක් යොදා තිබීමෙන් ඝණ මීටර් 3.08 ක් සඳහා රු.62,270 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, ප්‍රවාහන වියදම් රු.3,886 ක් වැඩිපුර ගෙවා තිබුණි. මාර්ගය ඉදිකිරීමට යොදා ඇති කොන්ක්‍රීට් මිශ්‍රණය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | මෙම ව්‍යාපෘතිය පරීක්ෂා කර, අදාළ වාර්තාව ඉදිරිපත් කරන බව හා වැඩිපුර ගෙවා ඇත්නම්, ඒවා අඩු කර ගැනීමට කටයුතු කරන බව | ප්‍රමාණවත් අධීක්ෂණයක් පවත්වා ගත යුතුය |
| (ආ) | මාර්ගය දෙපස රුක් රෝපණය හා නාම පුවරුව සවි කිරීමට රු.20,000 ක් ගෙවා ඇතත්, එම කාර්යය ඉටු කර නොතිබුණි. | මාර්ග දෙපස රුක් රෝපණයට ඉඩකඩ නොමැති බැවින්, සෝලංකන්ද නව ගම්මානයේ පැළ සිටුවා ඇති බව | ඉටු කරන ලද කාර්යයන් සඳහා ගෙවීම් කළ යුතුය |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේ දී, තනතුරු 08 ක සේවක පුරප්පාඩු 11 ක් හා එක් තනතුරක අතිරික්ත සේවක සංඛ්‍යාව 09 ක් විය. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙමින් නිරන්තරයෙන් ඉල්ලීම් කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය |
| (ආ) | **සේවක ණය**<br>ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් අය විය යුතු සේවක ණය රු.484,746 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ණය ශේෂ අය කළ යුතුය |